**උද්භිද උද්‍යාන භාර අරමුදල - 2014**

**---------------------------------------**

උද්භිද උද්‍යාන භාර අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා භාණ්ඩාගාරයේ ලේකම්, කෘෂිකර්ම ඉඩම් හා වනසම්පත් අමාත්‍යාංශයේ ලේකම්, උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ, මහා භාණ්ඩාගාරයේ අයවැය අධ්‍යක්ෂ සහ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් අතර, 1996 දෙසැම්බර් 20 දින එළඹෙන ලද ගිවිසුමෙහි (4)(ඡේ) ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට උද්භිද උද්‍යාන භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම් ඉදිරිපත් කිරීමේ අඩුපාඩු

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව ශේෂ පත්‍රය පිළියෙල කිරීමේදී සියළු වත්කම් හා වගකීම් ද්‍රවශීලතාවයේ අනුපිළිවෙලට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

2015 ජූනි 19 දින ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශනයේ ජංගම බැරකම් වශයෙන් රු.53,650 ක අවිනිශ්චිත ශේෂයක් පෙන්වා තිබුණු අතර, එය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 නොසැසඳූ පාලන ගිණුම්**

(අ) උපචිත වියදම් ලෙජර් ගිණුම පරීක්ෂාවේදී, වර්ෂයේ ආරම්භක ශේෂය හා වර්ෂය තුළ බැඳීම්වල එකතුව රු.8,872,644 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ රඳවාගත් මුදල් නිදහස් කිරීම රු.4,207,535 ක් වූයෙන් තවදුරටත් නිදහස් කළයුතු ශේෂය රු.4,665,109 ක් විය යුතු වුවත්, එය මූල්‍ය ප්‍රකාශන තුළ රු.4,982,251 ක් ලෙස ඉදිරිපත් කර තිබීමෙන් රු.317,142 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ කාරක පාඩු ගිණුමෙහි ඇතුළත් විකුණූ භාණ්ඩවල පිරිවැය හා විගණනයට ඉදිරිපත් කරන ලද සටහන් පත්‍රවල ඇතුළත් විකුණූ භාණ්ඩවල පිරිවැය පිළිවෙලින් රු.108,348 ක් හා රු.116,151 ක් වූයෙන් එම ශේෂ දෙක අතර රු.7,803 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වගකීම් කාලය ඉක්මවා තිබුණ නමුත්, නිරවුල් නොකර අත රඳවා ගෙන ඇති කොන්ත්‍රාත් 04 ක රැඳවුම් මුදල්වල වටිනාකම රු. 1,344,109 ක් වී තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.92,916,624 ක අතිරික්තයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.89,368,125 ක් වූයෙන් පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,548,499 ක වර්ධනයක්

පෙන්නුම් කර තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 06 ක වියදම රු.18,192,526 ක ප්‍රමාණයකින් වැඩි වුවත් ඊට සාපේක්ෂව ආදායම් විෂයයන් 02 ක වැඩිවීම රු.20,323,872 ක් වූයෙන් වියදම්වල ඉහළයාමට වඩා වැඩි වටිනාකමකින් ආදායම ඉහළයාම අතිරික්තය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

අරමුදල පිහිට වූ භාරකාර ලියවිල්ල මගින් උද්භිද උද්‍යානයේ වාර්ෂික ප්‍රවේශපත්‍ර ආදායමින් සියයට 25 ක මුදලක් උද්භිද උද්‍යාන අරමුදලට බැර විය යුතු බවට නීතිගත කර තිබුණද උපයන මුළු ආදායමම භාණ්ඩාගාරයට බැර කර තිබුණි. භාණ්ඩාගාරය විසින් වාර්ෂිකව ලබාදෙන මුදල උපයන ආදායමින් සියයට 25 ට වඩා අඩුවන බැවින් එම වෙනස ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. එම උපචිත ආදායම 1997 වර්ෂයේ සිට සමුච්චිත වෙමින් පවතින ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.50,401,172 ක් විය. ආදායම් ගිණුම්ගත කිරීමේදී ඒවා නිශ්චිතව ලැබෙන බව විචක්ෂණශීලීව හඳුනාගෙන ගිණුම්ගත කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

**4.2 අරමුදල් ඌන උපයෝජනය**

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ කාර්යයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.1,685,000 ක මුළු ප්‍රතිපාදනයෙන් රු.1,505,843 ක් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව උපයෝජනය කර තිබුණු මුළු මුදල රු.179,157 ක් වූ අතර, එය එක් එක් කාර්යය සඳහා වෙන්කර තිබුණු මූල්‍ය ප්‍රතිපාදනවලින් සියයට 01 සිට සියයට 40 අතර පරාසයක පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරි සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙළ කරන ලද වාර්ෂික අයවැය ලේඛනය වර්ෂය තුළ දෙවතාවක් සංශෝධනය වී තිබුණු අතර ඒ අනුව අයවැය ලේඛනයේ ඇතුලත් ඇතැම් ක්‍රියාකාරකම් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් වී නොතිබුණි.

**5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2006 වර්ෂයෙන් පසුව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5.3 නොවිසඳී ඇති විගණන ඡේද**

2013 මාර්තු 08 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පහත සඳහන් නියෝග ලබාදී තිබුණද 2015 මාර්තු 20 දින වන විටද එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(අ) අභ්‍යන්තර විගණකවරයකු පත්කරගන්නාතෙක් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් ගිණුම් පරීක්ෂා කළ යුතු බව නියෝග කර තිබුණද, එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය වෙනස්වීම නිසා භාරකාර මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව තිදෙනෙකු දක්වා අඩුවී ඇති බැවින් ඒ අනුව පනත සංශෝධනය කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ අනාවරණය වූ දුර්වලතා වරින්වර විගණන විමසුම් මඟින් අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) අයවැය පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) ණයහිමි පාලනය